**පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය**
**කැලණිය විශ්වවිද්‍යාලය**

# අන්වේෂණා

සවිද්වත් සමාලෝචිත ශාස්ත්‍රීය සංග්‍රහය

4 වන වෙළුම 2014

**උපදේශක සංස්කාරක**
මහාචාර්ය කොටපිටියේ රාහුල හිමි

**සංස්කාරකවරු**
ආචාර්ය පී. ආර්. වසන්ත ප්‍රියදර්ශන
ආචාර්ය ඩබ්ලිව්. එම්. දේශප්‍රිය ගුණසේන

**සංස්කරණ සහාය**
දර්ශනපති මඩිහේ සුගතසිරි හිමි

*මෙම සංග්‍රහයට අදාළ ව කෙරෙන විමසීම්:*
සංස්කාරක
පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය
අංක 113, දුටුගැමුණු වීදිය, කොහුවල.

## පටුන


I. අධ්‍යක්ෂ ස්වාමීන් වහන්සේගෙන්
From the Director

II. සංස්කාරක සටහන
From the Editors

1. මානව සම්පත් කළමනාකරණයට බෞද්ධ ප්‍රවේශයක් -
**අමිල සම්පත් කළුආරච්චි**

2. Postgraduate Research in Buddhist Studies: A Fundamental Bibliometric Survey of Postgraduate Theses Submitted to Postgraduate Institute of Pali & Buddhist Studies
**Geethani Attanayake**

3. තායිලන්තයේ බෞද්ධ කලාශිල්ප ඉතිහාසය
**අම්පාරේ ආනන්ද හිමි**

4. විනය පැනවීම පිළිබඳ කාලනිර්ණය
**ආචාර්ය, විජිත කුමාර මහතා**

5. Did Ascetic Siddhartha Practise Jainism?
**Dr. Vijitha kumara**

6. The Taoistism is one of the greatest philosophical Religion in the world
**Dr. M.D. Dunesh Gunathilake**

7. බුද්ධකාලීන ධර්මාර්ථ ව්‍යාඛ්‍යාන භාෂක ශ්‍රාවක-ශ්‍රාවිකාවෝ
**ආචාර්ය, ඩබ්ලිව්. ඇම්. දේශප්‍රිය ගුණසේන මහතා**

8. ථෙරවාද සම්ප්‍රදායයේ භාෂා මාධ්‍යය
**ආචාර්ය, ඩබ්ලිව්. ඇම්. දේශප්‍රිය ගුණසේන මහතා**

9. ථෙරවාද බෞද්ධ සම්ප්‍රදාය තුළ පූජනීය භාෂාව පිළිබඳ සංකල්පයෙහි ආරම්භය හා විකාශය
**මහාචාර්ය අසංග තිලකරත්න මහතා.**

10. Mind Only or Ideation Only: An Examination of Yogācāra Philosophy and Its Chinese Interpretation
**Ven. Prof. Medawachchiye Dhammajothi**

11. Logical Compatibility of the Buddhist Notion of an Enlightened Personality with the Ethics of Doing Good for Others (hitacchanda/dhammacchanda)
**Ven. Raluwe Padmasiri**

12. පාලි නිකාය සාහිත්‍යය විෂයෙහි සංස්කෘත ආඛ්‍යාත වරනැඟීම් රටාවන්හි ආභාසය (සුත්තනිපාතය ආශ්‍රයෙන්)
**මාවතගම පේමානන්ද හිමි**

13. මහලුවිය පිළිබඳ බෞද්ධ දැක්ම හෙවත් වෘද්ධ මනෝ චිකිත්සාව
**ආචාර්ය, වසන්ත ප්‍රියදර්ශන මහතා**

14. Cultural Bound Syndromes and Buddhist Psychotherapy
**Dr. Wasantha Priyadarshana**

15. The Competition of Sensitive Material *dhammas (pasādarūpa)* in Theravāda Abhidhamma
**Dr. Ashoka Welitota**

16. කම්මට්ඨානසංගහ හෙවත් කමටහන් පොත් - මහනුවර අස්ගිරි විහාරයේ කමටහන් පොත හඳුනා ගැනීම
**ආචාර්ය, මැදගම්පිටියේ විජිත ධම්ම හිමි**

17. ථෙරවාද අභිධර්මයේ දොළොස් අකුසල් සිත් පිළිබඳ විවරණයක්
**මිරිස්වත්තේ විමලඤාණ හිමි**

18. විසුද්ධදස්සන මඟින් අර්ථවත් වූ බුද්ධකාලීන භාරතීය සමාජයේ පැවති සංස්කෘතිකාංග පිළිබඳ විමසුමක්
**දිවුලපැලැස්සේ විමලානන්ද හිමි**

19. නෙත්තිප්‍රකරණය පිළිබඳ විවරණාත්මක අධ්‍යයනයක්
**මඩිහේ සුගතසිරි හිමි**

20. පන්සිය පනස් ජාතක පොත් වහන්සේගේ නිදාන කථාව සහ එහි පරිවර්තන රීතිය
**විමල් හේවාමානගේ**

21. Book Review
**Dr. Anuththaradevi Widyalankara**

# පන්සිය පනස් ජාතක පොත් වහන්සේගේ නිදානකථාව සහ එහි පරිවර්තන රීතිය

විමල් හේවාමානගේ

## හැඳින්වීම

සම්භාව්‍ය සිංහල ගද්‍ය හා පද්‍ය සාහිත්‍යයේ පෝෂණය විෂයෙහි ලා පාලි සාහිත්‍යයෙන් ලැබී ඇත්තේ අනල්ප දායකත්වයකි. සම්භාව්‍ය ගද්‍ය ග්‍රන්ථ වන අමාවතුර, බුත්සරණ, පූජාවලිය, සද්ධර්මරත්නාවලිය ආදී කෘති ඍජුව පාලි මූලාශ්‍රය ඇසුරු කරමින් සිංහල භාෂාවට ගැළපෙන සේ පෙළ ගස්වාගෙන තිබේ. සසඳාවත. මුවදෙව්දාවත, කව්සිළුමිණ, කාව්‍යශේඛරය වැනි කෘති ජාතකට්ඨකථාවෙන් මූලබීජ සපයා ගනිමින් නිර්මාණය කොට තිබේ. පාලි ජාතකට්ඨකථාව ත්‍රිපිටකයේ ඛුද්දකනිකායට අයත් ග්‍රන්ථයක් සේ සැලකෙන ජාතකපාලිය සඳහා ලියන ලද අට්ඨකථාවයි. සිංහල පන්සිය පණස් ජාතක පොත් වහන්සේ උක්ත පාලි ජාතකට්ඨකථාවේ පරිවර්තනය යි. ජාතකට්ඨකථාව තරම් ශ්‍රී ලාංකේය සමාජයේ ජනාදරයට පත් වූ කතන්දර සහිත කෘතියක් නොමැති තරම්ය. සිංහලයා විසින් වහන්සේ යන ගෞරවාර්ථ පදය ග්‍රන්ථ හැඳින්වීම සඳහා අවස්ථා දෙකකදී භාවිත කෙරේ. ඉන් එකක් වන්නේ 'පිරුවානා පොත් වහන්සේ'ය. එය සිංහල නමකින් යුතු සම්පූර්ණයෙන් ම පාලි භාෂාවෙන් සංග්‍රහ කරන ලද ග්‍රන්ථයකි. සිංහල භාෂාවෙන් රචිත වහන්සේ යනුවෙන් හඳුන්වනු ලබන එකම කෘතිය වන්නේ 'පන්සිය පනස් ජාතක පොත් වහන්සේ' ය. මේ අධ්‍යයනය පාලි ජාතකට්ඨකථාවේ සහ සිංහල පන්සිය පනස් ජාතක පොත් වහන්සේගේ අන්තර්ගත නිදාන කථාවට සීමා කෙරෙන අතර සිංහල ජාතක නිදානයෙහි නිරූපිත පරිවර්තන රීතිය පාලි ජාතකට්ඨකථාවේ නිදාන කථාව හා තුලනාත්මකව අධ්‍යයනය කිරීම මෙයින් අපේක්ෂා කෙරේ.

## පරිවර්තනය

සිංහල භාෂාවේ භාවිත කෙරෙන පරිවර්තන ශබ්දය සංස්කෘත භාෂාවෙන් සෘණීකෘත රූපයකි. එය වෘත් ධාතුවට පරි යන පූර්ව සර්ගය එකතුවීමෙන් සෑදේ. පරිවත්තෙති එහි ක්‍රියා රූපය වන අතර පරිවර්තන එහි නාමය යි. මේ සඳහා ඉංග්‍රීසි භාෂාවෙහි භාවිත කෙරෙන "translation" යන රූපය ලතින් භාෂාවේ "*translatio*" ("*transferre*" >"*translatus*">"*translatio*") යන්නෙන් බිඳගන්නා ලද්දකි. *transferre* යන රූපය *trans + ferre* යන රූප දෙකෙහි එකතුවක් වන අතර "acrÈs" +"to carry" or "to bring" යන අර්ථ එහි පවතී. ග්‍රීක භාෂාවේ පරිවර්තනය සඳහා "*metaphrasis*" (a speaking acrÈs) හා "*paraphrasis*"(a saying in other words) යන පද දෙක භාවිත කෙරේ. එය ඉංග්‍රීසි භාෂාවේ "metaphrase," (literal translation) සහ "paraphrase" (word-for-word) ලෙස දක්නට ලැබේ. ජාතක පොතෙහි මූලාශ්‍රය භාෂාව වන පාලියෙහි පැරණි මූලාශ්‍ර වල පරිවත්තනෙති, පරිවත්තති, පරිවත්තන වැනි රූප කිහිපයක් පමණක් යෙදී ඇතත් ඒවා භාවිත වී ඇත්තේ වර්තමානයේ අදහස් කරන පරිවර්තන යන අර්ථයෙහි නොවේ. සීහළට්ඨකථා පාලියට නැගූ බුද්ධඝෝස හිමියන් ඇතුළු කතුවරුන් විසින් භාවිත කරන ලද්දේ ආරොපයිත්වාන වැනි රූප බව පෙනේ. ප්‍රධාන නිකාය ග්‍රන්ථ හතරට ම අයත් අට්ඨකථා ආරොපෙන්තො යන රූපය භාවිත කොට තිබේ.

පරිවර්තන විෂය ලෝකයේ බෙහෙවින් ජනප්‍රිය ව ඇති යුගයක සාර්ථක පරිවර්තනයක ලක්ෂණ කොතෙක් දුරට ජාතක පොතෙහි අනුගමනය කර ඇත්දැයි නිදාන කථාව ඇසුරෙන් විමර්ශනය කිරීම මෙහි අභිප්‍රාය වේ. යම්කිසි කෘතියකින් කියැවෙන අර්ථය එහි කතුවරයා අපේක්ෂා කළ ආකාරයෙන් ම වෙනත් භාෂාවකින් ඉදිරිපත් කිරීම සැබෑ පරිවර්තනය වේ. පරිවර්තන ක්‍රියාවලියේ දී පරිවර්තකයා සතු මූලාශ්‍රය භාෂාව (Source Language) පිළිබඳ අවබෝධය, ලක්ෂ්‍ය භාෂාව (Targeted Language) පිළිබඳ අවබෝධය හා විෂය දැනුම මෙන් ම සංස්කෘතික අවබෝධය (awareness of subject and culture) යන කරුණු මූලික වශයෙන් සාර්ථක පරිවර්තනයක් බිහිකිරීමට උපකාරී වේ.

ජාතක නිදාන පරිවර්තනයේදි මූලාශ්‍රය භාෂාව හා ලක්ෂ්‍ය භාෂාව යන දෙක ම එක ම භාෂා පවුලේ භාෂා වීමත් මූලාශ්‍රය භාෂාව ලක්ෂ්‍ය



භාෂාවේ මාතෘත්වයෙහි ලා සැලකීමත් භාෂා දෙකෙහි පවත්නා සාම්‍යය ප්‍රකට කරයි. සිංහල ජාතක කතුවරයාට හෝ එම මණ්ඩලයට භාෂා පරිවර්තනයේ දී මුහුණ දිය යුතු භාෂා දැනුම පිළිබඳ අරගලය එතරම් ම දුෂ්කර වූවක් විය නොහැකි බව ඉන් පැහැදිලි වේ.

ජාතක කතාවල වස්තු විෂය මූලික වශයෙන් සත්ත්ව චරිත ඇතුළත් කතා, උපදේශ කතා, කල්පිත ප්‍රබන්ධ හා වීරචරිත කතා ආදි ලෙස විවිධ විචාරකයන් වර්ග කරතත් සමස්ත කතාවලින් අපේක්ෂා කර ඇත්තේ දුසිරිතින් ඈත් කොට සදාචාරවත් සමාජයක් ගොඩ නැගීමට අවශ්‍ය උපදෙස් ලබා දීම බව පෙනේ. විෂයයක් ලෙස සලකන කල්හි ජාතකට්ඨකථාව නියෝජනය කරන්නේ බෞද්ධාගමික සාහිත්‍යය යි. බොහෝ සම්භාව්‍ය සිංහල ගද්‍ය සාහිත්‍ය කෘති බෞද්ධ සාහිත්‍යයට අයත් පාලි මූලාශ්‍රයක පරිවර්තනයක් හෝ ඒ මග යමින් කරන ලද්දක් බව විශේෂයෙන් සඳහන් කළ යුතු නොවේ. එබැවින් සිංහල ජාතක කතුවරයා හෝ කතුවරු ගිහි හෝ පැවිදි භේද නොසලකා එවකට ශ්‍රී ලාංකිකයන් සතු ව තිබූ ප්‍රධාන සාහිත්‍ය ධාරාව වන බෞද්ධ සාහිත්‍යය පිළිබඳ අවබෝධයෙන් සිටීම සාමාන්‍ය කරුණක් සේ සැලකිය හැකි ය. ජාතක නිදානය ද නිරූපණය කරන්නේ එය ම වන බැවින් එය ද පරිවර්තනයේ සාර්ථකත්වයට හේතු වේ.

අනෙක් කරුණ වන්නේ මූලාශ්‍රය භාෂාව භාවිත කළ ජනතාවගේ සංස්කෘතිය පිළිබඳ අවබෝධය යි. ශ්‍රී ලාංකේය භික්ෂු සමාජය විසින් මහත් ගෞරවයෙන් රක්ෂණය හා පෝෂණය කරන ලද පාලි භාෂාව සිංහල ජාතක පොතේ මූලාශ්‍රය භාෂාව බව ඉහතින් දැක්විණි. සාම්ප්‍රදායික මතය අනුව ජාතකට්ඨකථාව මිහිඳු මහරහතන් වහන්සේ විසින් ඉන්දියාවේ සිට මෙහි ගෙනෙන ලද අතර එය සිංහලයන්ගේ ප්‍රයෝජනය පිණිස සිංහලයට නගන ලදී. ඉන්පසු නැවතත් බුද්ධඝෝෂ හිමියන් විසින් එම සිංහල ජාතක කතා පාලියට නගන ලදී. දැනට පවත්නා ජාතකට්ඨකථාව එලෙසින් ම මිහිඳු මහරහතන් වහන්සේගේ කාලයේ තිබුණේ යැයි ඉන් අදහස් නොවේ. මේ අනුව මෙහි ඇතුළත් සංස්කෘතිය බොහෝ දුරට ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ සංස්කෘතිය බව තහවුරු වේ. විවිධ සංස්කෘතීන්ට අයත් කතා ජාතකට්ඨකථාවට ඇතුළත් විය හැකි වුව ද ඒවා කාලයක් ජනප්‍රවාද ලෙස පැවති ස්වකීය සංස්කෘතික ලක්ෂණ උරා ගැනීමෙන් පසු ජාතකට්ඨකථාවට එකතු වන්නට ඇත. මක්නිසා ද යත්, කථකයා සහ ශ්‍රාවකයා අතර ඇති අවබෝධය හා රසඥතාව අනුව ඇතැම් සංශෝධන එක්වීම කතන්දර

කලාවේ සාමාන්‍ය ලක්ෂණයක් බැවිනි. එනිසා ජාතක කතුවරයාට ඉංග්‍රීසි, රුසියන්, ජර්මන් වැනි කෘතියක් සිංහලට පරිවර්තනය කරනවාට වඩා පහසුවෙන් සිය පරිවර්තන කාර්ය කර ගෙන යන්නට හැකියාව ලැබෙන්නට ඇතැයි සිතිය හැකි ය.

පරිවර්තනය පිළිබඳ විශේෂ අවධානයට ලක්ව ඇති නූතන ලෝකයේ පරිවර්තන ක්‍රම රැසක් පිළිබඳ විචාරකයන්ගේ අවධානය යොමුවී තිබේ.

1. Literal Translation - වචනයෙන් වචනය කෙරෙන පරිවර්තනය
2. Faithful Translation - මූලාශ්‍රය භාෂාවේ ව්‍යාකරණමය සහ වචන අසාමාන්‍යතා ආරක්ෂා කිරීම හා සංස්කෘතික වචන මාරු කිරීම
3. Semantic Translation - විශ්වසනීය පරිවර්තනයට වඩා බෙහෙවින් නම්‍යශීලී, කතුවරයාගේ වාග්විද්‍යාත්මක දැනුම අනුව කෙරෙන පරිවර්තනය
4. Adaptation Translation - නාට්‍ය හා කාව්‍ය පරිවර්තනයට යොදා ගන්නා ඉතා නිදහස් පරිවර්තනය
5. Free Translation - මූලාශ්‍රයේ අන්තර්ගතය ගැන නොසලකා කෙරෙන පරිවර්තනය
6. Idiomatic Translation - මූලාශ්‍රයයේ පණිවුඩය ප්‍රතිනිර්මාණය කරන අතර එහි ඇති සාමාන්‍ය ව්‍යවහාරය සහ වාක් ප්‍රයෝග ඉදිරිපත් නොකෙරෙන පරිවර්තනය



7. Communicative Translation - සැබෑ සන්දර්භානුගත මූලික අන්තර්ගතය හා භාෂාව යන දෙක ම පාඨකයාට පිළිගත හැකි හා අවබෝධ කර ගත හැකි වන සේ කෙරෙන පරිවර්තනය උක්ත පරිවර්තන අතරින් Semantic Translation හා Communicative Translation යන දෙක පමණක් පරිවර්තනයේ අරමුණු ඉටු කරනු ලැබේ.

ජාතක නිදාන පරිවර්තනය හුදු එක් පරිවර්තන කාණ්ඩයකට සීමා කළ නොහැකි අතර එහි මූලාශ්‍රයේ අන්තර්ගතය ගැන නොසලකා කෙරෙන පරිවර්තනයක ලක්ෂණ හැර වචනයෙන් වචනය කෙරෙන පරිවර්තනය, සැබෑ සන්දර්භානුගත මූලික අන්තර්ගතය හා භාෂාව යන දෙක ම පාඨකයාට පිළිගත හැකි හා අවබෝධ කර ගත හැකි වන සේ කෙරෙන පරිවර්තනය වැනි පර්වර්තනවලදී හමුවන බොහෝ ලක්ෂණ දක්නට ලැබේ.

**නිදාන කථාවේ පරිවර්තන රීතිය**

පාලි අට්ඨකථාවල දක්නට ලැබෙන පොදු ලක්ෂණයක් වන්නේ පෙළ ග්‍රන්ථයට අදාළ අර්ථ වර්ණනාව ආරම්භ කිරීමට පෙර බෝසත් සිරිත, බුදු සිරිත හා ශාසන ඉතිහාසයට අදාළ තොරතුරු ඇතුළත් කරමින් ප්‍රස්තාවනාවක් එකතු කිරීම යි. මේ කොටස නිදාන කථා හෝ බාහිර නිදාන වණ්ණනා වැනි නමකින් හැඳින්වෙන අතර එහි අන්තර්ගතයේ ප්‍රමාණාත්මක වෙනස්කම් ද දැකිය හැකි ය. ප්‍රථම සංගායනා ත්‍රයට අදාළ ශාසනික ඉතිහාසය ඇතුළත් කරමින් රචිත සමන්තපාසාදිකා බාහිර නිදාන වණ්ණනා, අභිධර්මයේ ඓතිහාසිකත්වය තහවුරු කරමින් රචිත අත්ථසාලිනී නිදාන කථාව සහ දීපංකර පාදමූලයේ පටන් බුදුසිරිත දක්වමින් රචිත ජාතකට්ඨකථා නිදාන කථා ප්‍රමාණයෙන් දීර්ඝ නිදාන ගණයට අයත් වේ. සමස්තයක් ලෙස පාලි නිදාන කථාව සහ සිංහල නිදාන කථාව තුලනය කිරීමේදී සිංහල කෘතියේ මූලික ලක්ෂණ කිහිපයක් හැඳින ගත හැක.

1. සංක්ෂිප්ත කරණය.
2. මූලාශ්‍රය දැක්වීමේ විධික්‍රම
3 නව කොටස් එකතු කිරීම

යථෝක්ත වර්ගීකරණයේ සංක්ෂිප්තකරණය වෙත ප්‍රථමයෙන් අවධානය යොමු කෙරේ. එය පාලි කෘතියේ පවත්නා ගාථා පන්ති සම්පූර්ණයෙන් ම හෝ සුදුසු පරිදි අතහැරීම, තෝරාගත් ගාථාවල අදහස පමණක් සිංහලට නැගීම, භාණක මතවාද නොසලකා හැරීම හා කතාවේ ගලා ගෙන යාමට සෘජුව බල නොපාන කරුණු අතහැරීම යන කරුණු ප්‍රධානත්වයෙහි ලා සැලකිය හැකි ය.

පාලි ජාතකට්ඨකථාව ආරම්භයේ පද්‍ය එකොළහකින් යුත් ගාථා පන්තියක් දක්නට ලැබෙතත් සිංහල පොතෙහි ගාථා තුනක් පමණක් එයින් උපුටා දක්වා තිබේ. එහි දී පාලි කතුවරයා ගාථා තුනකින් තෙරුවන් වන්දනා කරන අතර සිංහල කතුවරයා තමන් විසින් ම නිර්මාණය කරන ලද එක් පාලි පද්‍යයක් ඉදිරිපත් කෙරේ.

සුමේධ පණ්ඩිතයා අභිනිෂ්ක්‍රමණයට හේතු තමන්ගේ ප්‍රාසාදයෙහි සිටිමින් කල්පනා කළේය. ගිහිගෙයි නානාවිධ දුක්ඛයන් මෙනෙහි කරමින් අභිණිෂ්ක්‍රමණයට සිත මෙහෙය වීම ජාතකට්ඨකථාවේ පළමුවෙන් ගද්‍යයෙන් කියා පසු ව එය ම විස්තර කෙරෙන බුද්ධවංස පද්‍ය පන්තිය උපුටා දැක්වේ. සිංහල කෘතියේ ගද්‍ය කොටස එලෙසින් ම සිංහලට නගන අතර බුද්ධවංස ගාථාවලින් ආරම්භක ගාථාව පමණක් උපුටා දක්වයි.

> අපරම්පි චින්තෙසි. යථා නාම ගූථරාසිම්හි නිමුග්ගෙන පුරිසෙන දූරතොච පඤ්චවණ්ණපදුමසඤ්ඡන්නං මහාතළාකං දිස්වා..., කිලෙසවිනාසකස්ස ආචරියස්සාති, තෙන වුත්තං. යථා ගූථගතො පුරිසො..., එවං කිලෙසමධොවෙ..., යථා අරීහි පරිරුද්ධො..., එවං කිලෙෂ පරිරුද්ධො..., යථාපි බ්‍යාධිතො පුරිසො..., එවං කිලෙසබ්‍යාධීහි... (ජාතකට්ඨකථා 1926: 4 පිට)

> "එම්බා සුමේධ පණ්ඩිතයෙනි, යම් සේ පුරුෂයෙක් මහත් අසූචි වළෙක්හි ගැලී කිළුටු වූ ගාත්‍ර ඇතිව සිටී ද? ඒ පුරුෂයා පස් පියුමෙන් ගැවසී ගත් සිහිල් පැනින් පිරී තිබෙන විලක් දැක,...... ඒ පුරුෂයාගේ ම දෝෂය මිස නිර්වාණ මාර්ගයෙහි දෝෂයක් නොවන්නේය.

> "යථා ගූථගතො පුරිසො - තළාතං දිස්වා පූරිතං
> න ගවෙසති තං තළාකං - න දොසො තළාකස්ස සො පෙ"
> (පන්සිය පනස් ජාතක පොත 2002: xii – xiii පිට).



මෙහි දැක්වෙන පරිවර්තනය හුදු ජාතකට්ඨකථාවේ පදානුගත පරිවර්තනයක් බව මොනවට පැහැදිලි වේ. එසේ වුවත් පරිවර්තනය අතරත් අභිනවයෙන් එකතු කොට ඇති "එම්බා සුමේධ පණ්ඩිතයෙනි" යන පාඨයෙන් ප්‍රාණවත් ස්වභාවයක් ආරෝපණය වී තිබේ. සමස්තයක් ලෙස ඊට අදාළ වර්ණනාවේ පද්‍ය දහඅටක් සිංහල කතුවරයා අතහැර තිබේ. පාලි ජාතකට්ඨකථා කතුවරයා පෙළ ග්‍රන්ථයක් වන බුද්ධවංසයට පාඨක අවධානය යොමු කරන්නේ පාඨක විශ්වාසය තීව්‍ර කිරීම පිණිස විය හැකි ය.

දීපංකර බුදුන් වහන්සේ සුමේධ පණ්ඩිතයාට නියත විවරණ දෙන අවස්ථාවේ දස පාරමිතා එකින් එක පිළිවෙළින් සම්මර්ශනය කළහ. ජාතකට්ඨකථාව ඒ පිළිබඳ වර්ණනා කොට බුද්ධවංස පද්‍ය උපුටා දක්වතත් සිංහල පොතේ සියලු ම පද්‍ය පන්ති අතහැර තිබේ.

බෝසතාණන් වහන්සේ සුමේධ තාපස ව සිටියදී පළක් බැඳ පාරමිතා සොයන විට පෙර බෝසත් සිරිත් පරිදි පහළ වන සියලු පූර්වනිමිති එදින පහළ වූ බව ජාතකට්ඨකථා කතුවරයා දක්වන්නේ බුස්ධවංසයෙන් උපුටා ගත් පද්‍ය තිස් අටක් උපයෝගී කර ගනිමිනි. සිංහල ජාතක පොතෙහි ඊට අයත් ගාථා පන්තියෙන් දාහතර වන පද්‍යයේ සිට විසිවන ගාථාව දක්වා ඇති ගාථා අට ද විසිතුන් වන ගාථාව ද යන ගාථා නවයේ පමණක් භාවාර්ථය සිංහලට නගා තිබේ.

> "පෙර බෝසතුන්ගේ පාරමිතා සෙවීමෙහි අධික වූ උෂ්ණ උපසම වෙයි; ශීත ව්‍යපගත වෙයි. ඒ සියල්ල ද අදත් විද්‍යමාන විය. එසෙයින් ඒකාන්තයෙන් බුදු වන සේක් ම ය......... දසදහසක් සක්වළ සියලු නරකවල ගිනි නිවී ගියේ වෙයි. අදත් එසේ ම විය. ඒ කාරණයෙනුත් ඒකාන්තයෙන් බුදු වන සේක් ම ය." (පන්සිය පනස් ජාතක පොත. 2002: xvi පිට)

සමස්තයක් ලෙස සිංහල ජාතක නිදානයෙහි පාලි ගාථා එකොළහක් දැක්වෙන අතර ඉන් එක් ගාථාවක් පමණක් ජාතකට්ඨකථාවේ දක්නට නොලැබේ. ජාතකට්ඨකථා නිදානයේ දක්නට ලැබෙන සම්පූර්ණ ගාථා ප්‍රමාණය තුන්සියයක් වන අතර එයින් ගාථා දහයක් පමණක් සිංහල කතුවරයා උපුටා ගැනීමෙන් සංක්ෂිප්තක මොනවට පැහැදිලිවේ.

බෝධිසත්ත්වයන්ගේ විවරණ ලැබීම පිළිබඳ ප්‍රවෘත්ති දැක්වීමේදී ජාතකට්ඨකථාව බුදුවරයා, බෝසත් ආත්ම භාවය, කරන ලද පින්කම, බුදුවරයාගේ නගරය, පියා, මව, අග්‍රශ්‍රාවකයන් දෙදෙනා, උපස්ථායක, අග්‍රශ්‍රාවිකාවන් දෙදෙනා, බෝධිය, ශරීර ප්‍රමාණය හා ආයුෂ යන කරුණු සියල්ල ම දක්වන අතර ජාතක පොත බෝසත් ආත්ම භාවය හා කරන ලද පිංකම පමණක් දක්වා තිබේ. (උපග්‍රන්ථය බලන්න)

බෝසතුන් අභිනිෂ්ක්‍රමණය කළ පසු ධම්මික පර්වතය නිසා දෝෂ පහකින් තොර වූ පන්සලක් හා සක්මන් මලුවක් ද නවදෝෂ සමන්වාගත සාටක යුගලය හැර ද්වාදස ගුණ සමන්වාගත වාකචීවරය හැඳ පැවිදි වූ බව කෙටියෙන් සිංහලට නගා ඇත්තේ එම සංඛ්‍යාත්මක දහම් කරුණු දැක්වෙන සවිස්තරාත්මක පාලි ඡේද කිහිපයක් අතහැර දමමිනි (ජාතකට්ඨකථා 1926: 7 - 11 පිටු, පන්සිය පනස් ජාතක පොත 2002: xiii පිට).

සිංහල කතුවරයා භාණක මතවාද අතහැර තිබීම ද සංක්ෂිප්තකරණයේ එක් ලක්ෂණයකි. දිනක් උයන් බිමට යනු කැමති බෝසතාණන් දුටු එක් දෙවියෙක් මහලු වෙසක් මවා ගෙන බෝසතුන්ට පෙනෙන්නට සැලැස්වීය. මේ පිළිබඳ රාථාචාර්යයා ගෙන් තොරතුරු දැන ගත් කුමාරයා ගමන නවතා ආපසු මන්දිරයට ගියේය. සිද්ධිය දැනගත් සුද්ධෝදන මහරජතුමා සියලු සම්පත් සකසා ආරක්ෂක විධිවිධාන යෙදුවේය. මෙලෙස සිද්ධාර්ථ කුමාරයාගේ සතර පෙර නිමිති දැකීම දින හතරක් ඇතුළත පිළිවෙළින් සිදුවූවක් බව ජාතකට්ඨකථාවේ ප්‍රථමයෙන් දක්නට ලැබේ. ඉන්පසු භාණක මතයක් ඉදිරිපත් කරමින් සතර පෙර නිමිති එක් දිනයක දී දක්නා ලද බව දීඝභාණකයන්ගේ මතය ගෙන හැර දක්වා තිබේ (**දීඝභාණකා පනාහු චත්තාරි නිමිත්තානි එකදිවසෙනෙව දිස්වා අගමාසිති.** ජාතකට්ඨකථා 1926: 58 පිට). එසේ වුවත් සිංහල ජාතක පොත ඒ පිළිබඳ කිසිඳු සටහනක් නොකොට ඒ වාක්‍යය අතහැර පරිවර්තනය කොට තිබේ.

බුද්ධත්වයෙන් පසු සත්සති ගත කළ අවස්ථාව පිළිබඳ ප්‍රවෘත්තිය කෘති දෙකෙහි ම ඇතුළත් වේ. ඒ අනුව සතර වන සතිය දෙවියන් විසින් මවන ලද "රතනඝරයෙහි" අභිධර්මපිටකය මෙනෙහි කළ බව කියැවේ. එහෙත් ආභිධර්මික මතවාදයක් ගෙන හැර දක්වන ජාතකට්ඨකථාව මෙහි රතනඝර යනු රුවන්මය ගෙයක් නොව සප්ත ප්‍රකරණය මෙනෙහි කළ ගෙය බව දක්වා තිබේ. (ජාතකට්ඨකථා 1926: 74 පිට) සිංහල කෘතිය ඒ පිළිබඳව ද කිසිවක් සටහන් කර නැත.



පස්වන සතිය අජපාල නම් නුගරුක මුල වැඩ සිටියදී මාර ස්ත්‍රීන්ගේ අභිප්‍රාය පැරද වූ බව පමණක් ජාතක පොතෙහි දැක්වේ. ජාතකට්ඨකථාවේ ආචරීයවාදයක් ද මෙහි දක්වා තිබේ. මහත් ස්ත්‍රී භාවයෙන් පැමිණි මරදූවරුන්ගේ වේශය දුටු බුදුන් වහන්සේ කැඩුණු දත් පැසුණු කෙස් වේවා යි අධිෂ්ඨාන කළ බව දැක්වේ. එහෙත් ජාතකට්ඨකථාව ද එම මතය ප්‍රක්ෂේප කොට තිබේ (ජාතකට්ඨකථා 1926: 76 පිට). බෝසතුන් අභිනිෂ්ක්‍රමණය කරන විට රාහුල කුමරු ඉපදී දින හතක් වූ බව ජාතකට්ඨකථාවේ පමණක් ඇති බව දැක්වේ (ජාතකට්ඨකථා 1926: 60 පිට). මෙවැනි අවස්ථාවල ඇති මතභේදාත්මක කරුණු අතහැරීමේදී ද සිංහල ජාතක පොතෙහි ඉලක්ක සමාජය පොදු ජනතාව වීම බලපාන්නට ඇති බව පෙනේ. එම කරුණු පොදු ජනයාගේ ශ්‍රද්ධාව තීව්‍ර කිරීමට වඩා ඊට බාධා කරනු ඇතැයි පරිවර්තකයා සිතන්නට ඇත.

යථොක්ත සංක්ෂිප්තකරණ ග්‍රන්ථයේ ගලාගෙන යෑමට හානියක් නොවන අතර සංක්ෂිප්තකරණය ග්‍රන්ථයට හානි කොට ඇති ප්‍රධාන අවස්ථාව ලෙස සිද්ධි අතහැරීම දැක්විය හැකි ය. ඒ අතර

- රාහුල කුමාරයාගේ උපත පිළිබඳ ප්‍රවෘත්තිය උයනේ සිටි සිද්ධාර්ථ කුමරයාට පියරජ තුමන් විසින් දන්වා යැවිණි. එම අවස්ථාවේ සිද්ධාර්ථ කුමාරයා "රාහු/ රාහුලො ජාතො, බන්ධනං ජාතන්ති" යැයි කී බවත් එම පුවත දැනගත් සුද්ධෝදන රජතුමා මුණුබුරාට රාහුල යන නම තැබූ බව (ජාතකට්ඨකථා 1926: 59 පිට)
- අභිණනිෂ්ක්‍රමණයට සූදානම් වූ දිනයේ සිද්ධාර්ථ කුමාරයාට යශෝධරා දේවියගේ තුරුලෙහි සිටි රාහුල කුමාරයා වඩා ගැනීමට අදහසක් ඇති වුවද ඉන් දේවිය පිබිදීමෙන් තම ගමනට සිදුවන බාධාව දැක බුදු වී පැමිණ ම පුතා බැලීමට සිතා කන්තක අසු පිටින් නික්මීම (ජාතකට්ඨකථා 1926: 60 පිට)
- බෝසතාණන් වහන්සේ දුෂ්කරක්‍රියා කරන සමයෙහි අපණ්ණක ධ්‍යානය වඩද්දී සිහිසුන් වී වැටුණු අතර එක් දේවතාවෙක් බෝසත් මිය ගියේයැ යි සිතා සුද්ධෝදන රජතුමාට දැන්වීය. සුද්ධෝදන රජ තමන්ගේ පුතා බුදුවී මිස මිය නොයන බව ප්‍රකාශ කිරීමේ පුවත (ජාතකට්ඨකථා 1926: 65 පිට)

- සුජාතා සිටු දියණිය කිරිපිඬු පිළිගන්වන දිනයේ පුණ්ණා නම් දාසිය ඉන් නිදහස් කොට දෙටු දියණියගේ තනතුරෙහි පිහිටුවීම. (ජාතකට්ඨකථා 1926: 66-67 පිටු)
- මාරයාගේ උත්සාහය ව්‍යර්ථ වූ පසු මාරදූවරුන් ඊට උත්සාහ කිරීමේ දී පියා සමග වන සංවාදය (ජාතකට්ඨකථා 1926: 75-76 පිටු)
- තපස්සු භල්ලුක දෙදෙනාගේ මී පිඬු පූජාව දක්නට ඇතත් ද්වෙවාචික උපාසකයන් වීමේ පුවත (ජාතකට්ඨකථා 1926: 77 පිට)

වැනි බුදුසිරිතේ ප්‍රකට අවස්ථා අතහැරීම පිළිබඳ අප අවධානය යොමුවිය යුතු ය.

සිංහල ජාතක පොත මූලාශ්‍රය දැක්වීමේදී පාලි මූලාශ්‍රය දැක්වීම බොහෝ දුරට මගහැර තිබේ. එක් අතකින් ජාතක පොතේ පාඨක සමාජයේ හා ජාතකට්ඨකථාවේ පාඨක සමාජයෙහි වූ වෙනස මීට හේතු වන්නට ඇත. පාලි ජාතකට්ඨකථාව රචනා කරන ලද්දේ බුද්ධවචනය පිළිබඳ ප්‍රාමාණික හැදෑරීමක් කළ පාලි මූලාශ්‍රය පිළිබඳ අවබෝධයෙන් යුත් පාඨක සමාජයකට බව පෙනේ. එම පාඨක සමාජය හුදු කරුණු ඉදිරිපත් කිරීමකට වඩා මූලාශ්‍රයානුගත කරුණු ඉදිරිපත් කිරීම රුචි කරනු ඇත. එහෙත් සිංහල ජාතක පොතේ පාඨක සමාජය මූලාශ්‍රය සොය බැලීමට වඩා හුදු ශ්‍රද්ධාව පදනම් කරගත් පාඨක සමාජයක් බැවින් ඔවුන්ගේ ශ්‍රද්ධාව දියුණු කිරීම කතුරයාට පැවරුණු ප්‍රමුඛ කාරණයක් විය හැකි ය.

පාලි මූලාශ්‍රය වෙත පාඨක අවධානය යොමු කිරීම සංක්ෂිප්තකරණය පිණිස ජාතකට්ඨකථාව අනුගමනය කරන ලද්දකි. දීපංකර බුදුසිරිත කෙටියෙන් දක්වා "එහි යමක් කිව යුතු ද ඒ සියල්ල බුද්ධවංසයෙහි කී ආකාරයෙන් දත යුතු ය. එහි කියන ලදි." (තත්ථ යං වත්තබ්බං තං සබ්බං බුද්ධවංසෙ වුත්තතයෙනෙව වෙදිතබ්බං. වුත්තං හි තත්ථ. ජාතකට්ඨකථා 1926: 28 පිට) යනුවෙන් ද දසපාරමිතා කෙටියෙන් දක්වා "විස්තර වශයෙන් මෙහි අර්ථය චරියාපිටකයෙන් ගත යුතු ය." (විත්ථාරතො පනෙස අත්‍ථො චරියාපිටකතො ගහෙතබ්බො. ජාතකට්ඨකථා 1926: 46 පිට) යනුවෙන් ද බුදු වී පළමුවෙන් තමන්ගේ නගරයට එන්නැයි බිම්බිසාර රජතුමන් විසින් කරන ලද ආරාධනය දැක්වෙන ස්ථානයේ මේ මෙහි සංක්ෂිප්තය යි. විස්තර පබ්බජ්ජා සූත්‍රයෙන්



හා එම අටුවාවෙන් දත යුතු යැයි (අයමෙත්ථ සංඛෙපො. විත්ථාරො පන පබ්බජ්ජං කිත්තයිස්සාමි යථා පබ්බජි චක්ඛුමාති ඉමං පබ්බජ්ජාසුත්තං සද්ධිං අට්ඨකථාය ඔලොකෙත්වා වෙදිතබ්බො. ජාතකට්ඨකථා 1926: 64 පිට) දක්වා තිබීමෙන් ද එය සනාථ වේ.

සිංහල ජාතක පොත මේ වෙනුවට බොහෝදුරට කරනු ලබන්නේ සිංහල මූලාශ්‍රය වෙත පාඨක අවධානය යොමු කරවීම යි. "එක් ස්වර්ණ පර්වතයක් නිසා වැඩ සිට පිරිනිවි පරිදි නිදානවර්ණනායෙන් හා සද්ධර්මරත්නාකරයෙන් බලා දත යුතු" (පන්සිය පනස් ජාතක පොත 2002: xxv පිට) මෙහි නිදාන වර්ණනාව යනු සිංහල බුද්ධවංශයේ නිදාන කථාව යි. මීට අමතරව මහපූජාවලිය වැනි මූලාශ්‍රය වෙත ද සහෘද අවධානය යොමු කොට තිබේ.

ජාතක නිදානයෙහි අප අවධානය යොමු කෙරෙන අවසාන කාරණය වන්නේ අභිනව එකතු කිරීම් සම්බන්ධයෙනි. ජාතක කතුවරයාගේ නව එකතු කිරීම් ක්‍රම තුනකින් දැකිය හැකි ය.

1. පාලි පෙළ අනුව යමින් අතරින් පතර කෙටි වැනුම් යෙදීම.
2. පාලි පෙළෙහි අර්ථය සිත තබා ස්වාභිමතය පරිදි වර්ණනා කිරීම
3. පෙළෙහි කිසිසේත් දක්නට නැති කරුණු එකතු කිරීම

බුදුන් වහන්සේගෙන් දායාද ඉල්ලා යන රාහුල කුමාරයාගේ පුවත පෙළ අනුව යමින් අතරින් පතර කෙටි වැනුම් යොදමින් කරන ලද වර්ණනයක් ලෙස හැඳින්විය හැකි ය. සිංහල කතුවරයාගේ එකතු කිරීම් වචන කිහිපයකට හෝ වාක්‍ය කිහිපයකට සීමා වුව ද සිංහල පාඨකයාගේ රුචිකත්වය සහ රසඥතාව වර්ධනය කිරීමට එය සමත් වන බව කිව යුතු ය. සිංහල ජාතක පොතෙහි එකතු කිරීම් හොඳින් පැහැදිලි වනු පිණිස උක්ත සිද්ධියට අදාළ පරිවර්තනය පාලි ජාතකට්කථාවේ පෙළ සමග කොටස් කර පහත වගුවෙහි දක්වා තිබේ.

| ජාතකට්ඨකථා | ජාතක පොත |
|---|---|
| 1. පස්ස, තාත එතං වීසතිසහස්සසමණපරිවුතං සුවණ්ණවණ්ණං බ්‍රහ්මරූපවණ්ණං සමණං අයං තෙ පිතා එතස්ස මහන්තා නිධයො අහෙසුං ත්‍යාස්ස නික්ඛමනකාලතො පට්ඨාය න පස්සාම. ගච්ඡ, නං දායජ්ජං යාචාහි. අහං තාත කුමාරො අභිසෙකං පත්වා චක්කවත්තී භවිස්සාමි. ධනෙන මෙ අත්ථො. ධනං මෙ දෙහි. සාමිකො හි පුත්තො පිතු සන්තකස්සාති. | යසෝධරා දේවී පුතණුවන් වඩා ගෙන සීමැදුරු කවුළුයෙහි දොර හැර රාජ වීථියෙහි කසුන් කඳක් සේ සවනක් රැසින් දිලිහි දිලිහි වඩනා බුදුන් පුතණුවන්ට අත දිගුකර පෙන්නා සාක්‍යකුමාරවරො සුකුමාලො යනාදින් නරසීහ ගාථා උගන්වා සත්බුමු පායෙහි යට මහලට බැස පුතණුවන් යවා නැවත තුමූ උඩුමහළට නැගී සිංහපඤ්ජරයෙන් බල බලා නොපෙනී සිටියහ. |
| 2. කුමාරො ච භගවතො සන්තිකං ගන්ත්වා පිතු සිනෙහං පටිලභිත්වා හට්ඨතුට්ඨො 'සුඛා තෙ සමණ, ඡායා'ති වත්වා අඤ්ඤං ච බහුං අත්තනො අනුරූපං වදන්තො අට්ඨාසි. | එකල රාහුල කුමාරයෝ බුදුන් පියාණෝ යැයි අසා සතුටුව බුදුන් කරා ගොස් බුදුන්ගේ සිවුරු කොන අල්වා ගෙන මුහුණ බලා මහණ මම නුඹගේ දරුවෙක්ල. නුඹ මා උපන් දවස් මා දුරදී දැක මා කරා නොවැද සොරා ම ගියේල. එසේ ඔබ දැඩි වුවත් තොපගේ සතර මහ නිධානය සහ චක්‍රවර්ති රාජ්‍යය මට දෙව යි බොළඳ තෙපුල් කීහ. |
| 3. භගවා කතභත්තකිච්චො අනුමොදනං කත්වා උට්ඨායාසනා පක්කාමි. | එකල බුදුහු රාහුල කුමාරයන්ගේ ඇඟිල්ල ශ්‍රී හස්තයෙන් අල්වා ගෙන වරෝ දරුව දායාද දෙන්නමෝ වේදැයි රජගෙට වැඩ දන්වළඳා බුද්ධාසනයෙන් පැන නැගී නික්මුණු සේක. |
| 4. කුමාරොපි දායජ්ජං මෙ සමණ දෙහි දායජ්ජං මෙ සමණ දෙහීති භගවන්තං අනුබන්ධි. | රාහුල කුමාරයෝ බුදුන්ගේ සිවුරු කොණ ගැවී ගැවී ම දායාද ලෝභයෙන් නික්මුණාහ. |
| 5. භගවා කුමාරං න නිවත්තාපෙසි. පරිජනොපි භගවතා සද්ධිං ගච්ඡන්තං නිවත්තෙතුං නාසක්ඛි. ඉති සො භගවතා සද්ධිං ආරාමමෙව අගමාසි. | බුදුන් රාහුලය, තෝ සිටුවයි නොවදාරණ සේක් රාහුල කුමාරයෝ නවතාලන කිසිකෙනෙක් නැත්තාහු ම ය. එකල යශෝධරා දේවී බුදුන් හා කැටිව යන පුතණුවන් සිංහපඤ්ජරයෙන් බලා දැක කිමෙක් දෝ හෝ නන්ද කුමරුවා සේ ම මපුතණුවන් ගෙන ගොස් මහණ කරවා ගන්නා උපායෙක් දෝ හෝයි දායාද තබා මපුතණුවන් ලදින් නම් මැනවැයි සිත සිතා හඩමින් සිටියාහුය. |

(ජාතකට්ඨකථා 1926: 87 පිට, පන්සිය පනස් ජාතක පොත 2002: xxxvii පිට).



සිංහලයා සිය ආගමික කටයුතුවලදී ඊට අනන්‍ය වූ උපභාෂාවක් සකස් කර ගෙන තිබේ. පාලි භාෂාවෙහි දක්නට නොලැබෙන ගෞරවාර්ථ ප්‍රයෝග වැනි වාක්‍ය වින්‍යාස එහිලා දක්නට ලැබේ. භගවා... පක්කාමි, කුමාරොපි... අනුබන්ධි' යන පාලි වාක්‍යවල උක්තය ඒකවචන වන අතර ආඛ්‍යාතය ද ඒකවචන වේ. එහි සිංහල පරිවර්තනයේ පිළිවෙළින් 'බුදුහු ... නික්මුණු සේක', 'රාහුල කුමාරයෝ... නික්මුණාහ' යනුවෙන් උක්තය ප්‍රත්‍යයෝගයෙන් බහුවචන බවට හරවා ගෙන ඇති අතර ඊට අනුරූපීව ආඛ්‍යතය ද බහුවචනයෙන් තබා තිබේ.

දෙවැන්නෙහි සිංහල කෘතිය බොහෝ දේ එක්කර ඇතත් 'සුඛා තෙ සමණ, ඡායා' (ශ්‍රමණයන් වහන්ස, ඔබගේ සෙවණ සැපයි) යන පාලි පාඨය අතහැරීමෙන් අවස්ථාව වඩාත් තීව්‍ර කිරීමට තිබූ අවස්ථාව ගිලිහී ගොස් ඇති බවක් පෙනේ.

පස්වන සතියේ බුදුන් වහන්සේ අජපාල නුගරුක මුල වැඩ සිටියදී බුදුන් කාමයට පෙළඹවීමට පැමිණි මාරදූවරු තිදෙනා පැරද පලා ගිය ආකාරය දැක්වෙන "මුඛ නැමති අම්බුජ වනය දේශනා නැමැති සඳරැසින් මලානික කරවා ත්‍රෛලෝකාග්‍ර සර්වඥ නැමැති චන්‍ද්‍ර දිව්‍ය රාජතෙම" යන යෙදුම ද, බුදුව පස්වග මහණුන් සොයා යන බුදුන් වහන්සේ දුටු පස්වග මහණුන් උපහාසාත්මකව "රසමසවුලෙන් යුක්ත වූ මධුර ආහාර අනුභව කොට ශරීර වර්ණය ලදින් රන් කඳක් සේ දිලිහි දිලිහී බුදු ව ගත නොහී අප කරා දැන් එතී" යන යෙදුම ද, පස්වග මහණුන් පුටුවක් පමණක් බුදුන් වහන්සේට දීමට කළ කථාව අසාර්ථක වූ ආකාරය "බලවත් වතුරෙන් ඉපිලෙන පරඬලා පත්සේ හුනස්නෙහි හිඳගත නොහී" යන යෙදුම ද, පස්වග මහණුන් සමඟ රාත්‍රී ගත කිරීම "ඍ තරු පිරිවැරූ සඳක් සේ" වැනි කෙටි වැණුම් සිංහල ජාතක කතුවරයාගේ බව පැහැදිලි ය. උරුවේල කාශ්‍යප ජටිලයා බුදුන්ගේ ශ්‍රාවකයෙක් ද බුදුන් වහන්සේ උරුවේල කාශ්‍යප ජටිලයාගේ ශ්‍රාවකයෙක් ද? යන සැකය රැස් ව සිටි පිරිසට ඇති වූ බැවින් උරුවේල කාශ්‍යප බුදුන් වැඳ "එම්බා අඥාන සත්වයෙනි, මාගේ සාමිදරුවන් මා හා සම කොට නොසිතව, මාගේ ස්වාමි දරුවන් නිසා මම සංසාර සාගරයෙන් ගොඩ නැංගෙමි, බුදුහු මට මව් සේක, පිය සේක, ගුරු සේක, ස්වාමි දරු සේක." යැයි ප්‍රකාශ කිරීම ද එවැන්නකි (පන්සිය පනස් ජාතක පොත 2002: xxxix පිට). මෙහි එකතු කොට ඇත්තේ කෙටි වැකියක් වුව ද සාහිත්‍ය රසයෙන් අනූන එම යෙදුම එහි අර්ථය තිව්‍ර කිරීමෙහි ලා උපයෝගී වී ඇති බව පෙනේ.

බුදුන්වහන්සේ ප්‍රථම ධර්ම දේශනයට පෙර තමන් අවබෝධ කරගත් ධර්මයේ ඇති ගැඹුරු බව නිසා ම එය දේශනා කිරීමට මන්දෝත්සාහී වීම හා මහාබ්‍රහ්මයා ඊට ආරාධනා කිරීම ජාතකට්ඨකථාවේ සංක්ෂේපයෙන් දැක්වෙන ඡේදය සිංහල පොතෙහි සවිස්තරාත්මකව ඡේද දෙකක් පුරා වර්ණනා කර තිබේ.

"සම්මාසම්බුද්ධොපි ඛො තතො උට්ඨාය පුන අජපාලනිග්‍රොධමෙව ගන්ත්වා නිග්‍රොධමූලෙ නිසීදි. අථස්ස තස්ස නිසින්නමත්තස්සෙව අත්තනා අධිගතස්ස ධම්මස්ස ගම්භීරතං පච්චවෙක්ඛන්තස්ස සබ්බබුද්ධානං ආචිණ්ණො, 'අධිගතො ඛො මයායං ධම්මො'ති පරෙසං ධම්මං අදෙසෙතුකම්‍යතාකාරපවත්තො විතක්කො උදපාදි. අථ බ්‍රහ්මා සහම්පතී 'නස්සති වත භො ලොකො විනස්සති වත භො ලොකොති දසහි චක්කවාළසහස්සෙහි සක්කසුයාමසන්තුසිත සුනිම්මිතවසවත්තිමහාබ්‍රහ්මානො ආදාය සත්ථු සන්තිකං ගන්ත්වා දෙසෙතු භන්තෙ භගවා ධම්මන්ති' ආදිනා නයෙන ධම්මදෙසනං ආයාචි" (ජාතකට්ඨකථා 1926: 77 පිට).

"එයින් නික්ම නැවත අජපාල නිග්‍රොධ වෘක්ෂ මූලයට වැඩ බුදුන්ගේ සිරිත් හෙයින් ධර්ම දේශනා කිරීමෙහි මන්දෝත්සාහයට පැමිණ, "මා විසින් අවබෝධ කරන ලද මේ නිර්වාණ ධර්මය තෙම මහ පොළොව පිහිටි උදකක්ඛන්ධයක් මෙන් අතිගම්භීර වන්නේය. පර්වතයකින් වසා තුබූ දෙයක් මෙන් කිසි කෙනෙකුන් විසින් නොදක්ක හැකිය. නොදක්ක හැකි බැවින් ම අවබෝධ කොට ගත නොහැක්කේය. නිවියා වූ සියලු ක්ලේශ පරිදාහ ඇති බැවින් ශාන්ත වන්නේය. මධුර රස ඇති භෝජනයක් සේ තෘප්තියකට නොපැමිණෙන කාරණයෙන් ප්‍රණීතය. ආර්යය ඥානයෙන් මිස සෙස්සන්ගේ කල්පනාවෙන් තර්කනය කොට ගත නොහැකි බැවින් අතර්කාවචරය. සියක්වර පළන ලද අස්ලොම් අගක් මෙන් ඉතා සූක්ෂම බැවින් නිපුණය. ධාත්වායතනප්‍රත්‍යයකාරණාකාරණා සංඛ්‍යාත චතුර්විධ කෞශල්‍යයෙන් යුක්ත පණ්ඩිත ජනයන් විසින් දැනගත යුතු බැවින් පණ්ඩිත වෙදනීය වන්නේය. එසේ වූ මේ ධර්මය ප්‍රතිවෙධ කරනු පිණිස උත්සාහ කරන්නා වූ මා විසින් වනාහි පැමිණි පැමිණි යාචකයන්ට මිණිවොටුනු ආදීන් සරහා පිළියෙල කරන ලද්දා වූ ඉස් කපා දන් දීමෙන් ද ලෝහිතය දීමෙන් ද මනා



කොට අඳුන් ගා සරහන ලද ඇස් උපුටා දීමෙන් ද කුවංශයට ප්‍රදීපයක් වැනි වූ පුත්‍රයන් හා මන වඩන්නා වූ භාර්යාවන් දන් දීමෙන් ද නුදුන්නා වූ දානයක් නම් නැත්තේය.

ශංඛපාල ජාතකාදී වූ ආත්ම භාවයන්හි තෘණ ලවයක් මෙන් කරන්නා වූ ජීවිත පරිත්‍යාග පොළෝ පෙරෙළීමක් මෙන් සිතන්නා වූ ශීලව්‍යතික්‍රමණය ඇති මා විසින් නොරක්නා ලද සීලයක් නම් නැත්තේය. චුල්ලසුතසෝමාදී වූ ආත්ම භාවයන්හි මනෝඥ වූ සම්පත්තිය පරිත්‍යාග කරන්නා වූ මා විසින් ද නුපුරන ලද කිසි පාරමිතාවක් නම් නැත්තේය. මෙබඳු වූ මා සවස් වේලෙහි මාර සේනාව විධ්වංසනය කරන්නහටත් මහීකම්පාව නොවීය. ප්‍රථම යාමයෙහි පූර්වේනිවාසානුස්මෘති ඥානය ලබන්නහුට ද මධ්‍යම යාමයෙහි දිව්‍යචක්ෂුරභිඥානය උපදවන්නාහට ද පෘථිවි තොමෝ කම්පා නොව පශ්චිම යාමයෙහි වනාහි ද්වාදශාංගප්‍රතීත්‍ය සමුත්පාදය අනුලෝම ප්‍රතිලෝම වශයෙන් ප්‍රතිවේධ කරන්නා වූ මට ම දස දහසක් සක්වළ යදණ්ඩකින් ප්‍රහාර ලත් ලෝ තලියක් මෙන් දස දහස් ගණන් ධ්වනි පවත්වමින් පවනින් පහරන ලද පියුම් පතෙක්හි පතිත ජල බින්දුවක් මෙන් කම්පා විය. මෙසේ "තීක්ෂණ ප්‍රඥා ඇත්තා වූ මා විසිනිදු, මේ ධර්මය දුක සේ ප්‍රතිවෙධ කරන ලද්දේය. මේ ලෞකික මහජනයෝ ක්ලෙශයන්ගෙන් හරිතයහ; ඉතා සංක්ලිෂ්ටයහ. රාගයෙන් රක්තයහ; ද්වේෂයෙන් දුෂ්ටයහ; චතුස්සත්‍යය නොදන්නා අවිද්‍යායෙන් මැඩ මිරිකා පියන ලදහ. එසේ වූ සත්වයෝ මෙසේ ගැඹුරු වූ ධර්මය කෙසේ නම් ප්‍රතිවෙධ කෙරෙද්ද? එසේ වූ ධර්මය දේශනා කිරීමෙන් ප්‍රයෝජන කවරේ ද?" යි ධර්ම දේශනාවට උපන්නා වූ මන්දෝත්සාහ ඇති සේක් වී පරිවිතර්කය දුටු සහම්පතී මහාබ්‍රහ්මයා විසින්, "**නස්සති වත භො ලොකො, විනස්සති වත භො ලොකෙ, යත්‍රහි නාම තථාගතස්ස අරහතො සම්මාසම්බුද්ධස්ස අප්පොස්සුක්කතාය චිත්තං නමති නො ධම්මදෙසනාය**" යනුවෙන් දශසහශ්‍රී ලෝකධාතුව ඒකනින්නාද කෙරෙමින් මහත් වූ ස්වරයක් විහිදුවා දස දහසක් සක්වළ මහාබ්‍රහ්මයන් හා දස දහසක් පරනිර්මිත දිව්‍ය රාජයන් හා දස දහසක් සුනිර්මිත දිව්‍යරාජයන් හා දස දහසක් තුසිත දිව්‍යරාජයන් හා දස දහසක් සුයාම දිව්‍යරාජයන් හා දස දහසක් ශක්‍රයන් හා සතළිස් දහසක් වරම් රජදරුවන් හා සමග බුදුන්ගේ අභිමුඛයට

ප්‍රාදුර්භූත ව උතුරු සළුව ඒකාංශ කොට පෙරවා දකුණු දණ මඩල බිම හැන දොහොත් මුදුනෙහි තබා, "දෙසෙතු භන්තෙ භගවා ධම්මං" යනාදීන් ධර්ම දේශනාවට යාඥා කළේය." ( පන්සිය පනස් ජාතක පොත 2002: xxxvi - xxxvii පිටු).

ජාතකට්ඨකථාවේ සන්තිකෙ නිදානයෙන් පසු අපණ්ණකාදී ජාතක කථා කීම ආරම්භ කෙරේ. සන්තිකෙ නිදානය අවසන් කරනු ලබන්නේ ජේතවනාරාම පූජා පුවතිනි. බුද්ධත්වයේ පටන් පරිනිර්වාණය දක්වා නිදානය සන්තිකෙ නිදානයට අයත් බව එක් වැකියකින් එහි කියා තිබේ. එසේ වුවත් සිංහල ජාතක පොත ඉන්පසු;

i. බුද්ධවංශයෙහි හෙවත් බුදුන්ගේ ජීවිත කතාවෙහි පූර්වාරාම පූජා කථාවෙහි පටන් පිරිනිවන් පෑම දක්වා සඳහන් වූ සන්තිකෙ නිදානයෙහි දෙවන භාගය
ii. බුද්ධවංශයෙහි හෙවත් බුදුන්ගේ ජීවිත කථාවෙහි පරිනිර්වාණ කථාව සහ ධාතු පරිනිර්වාණ කථාව
iii. බුද්ධවංශයෙහි ධර්ම සංගායනා කථා හා දේශනාර්ථ කථාදී පුස්තක ලේඛන කථාව

යනුවෙන් විශේෂ කොටස් තුනක් එකතු කොට තිබේ. එම කොටස් පාලි බුද්ධවංස අට්ඨකථාවේ ද දක්නට නොලැබේ. සිංහල ජාතක කතුවරයා ඒවා උපුටා ගෙන ඇත්තේ සිංහල බුද්ධවංශයෙන් බව පෙනේ. කුඩා කෘතියක් වන බුද්ධවංශයේ අන්තර්ගතය

1) සුමේධ කථාව
2) අවිදූරෙ නිදාන කථාව
3) සන්තිකෙ නිදාන කථාව - ප්‍රථම භාගය
4) සන්තිකෙ නිදාන කථාව - ද්විතීය භාගය
5) ධාතු පරිනිර්වාණය කථා
6) පුස්තක ලේඛන කථා

යන ශීර්ශ යටතේ වර්ග කෙරේ. ජාතක කතුවරයා එහි එන 4, 5, 6 යන අංක උපුටා ගෙන ඇති අතර මේ වර්ණනය සඳහා ජාතක කතුවරයා මුද්‍රිත A4 පිටු නවයක් යොදා ගෙන තිබේ.



තවද බුදුන් වහන්සේ ප්‍රථම ධර්ම දේශනයට සූදානම් වන විට ඇති වූ දෙතිස් මහා පුරුෂ ආශ්චර්ය ජාතකට්ඨකථාවේ දක්නට නොලැබේ.

"හැම බුදුන්ගේ චාරිත්‍රධර්මයක් වූ මංගල දේශනාව පිණිස වැඩ උන් කල්හි දස දහසක් සක්වළ දිව්‍ය බ්‍රහ්මයෝ, අපගේ ස්වාමි දහම් අමාවතුරෙහි අප හැම ගලා සංසාර දුක් නමැති මහගිම් නිවයි. ඔහුගේ දහම් අමාරස බොන්නට යම්හ" යි කියා, දිවමල් ආදිය ගෙන දිව අවුත් සක්වළ ගල පර්යන්ත ව අකනිටා බඹලොව දක්වා නලෙක පුරා ලූ රන් සුනු සමූහයක් සේ ඉතා සියුම් වෙස් මවා ගෙන අවකාශ නැති ව සිටගත්හ.

එකල බුදුන් වැඩ උන් බුද්ධාසනයෙහි පටන් බ්‍රහ්මාණ්ඩය දක්වා බුදුන් සිරසින් පැන නැගි බුදුරැස් කඳට ම අවකාශ විය. දෙව් විමනක් වේව' යි දෙව් බඹ කෙනෙක් වේව' යි එදා බුදුන්ගේ සිරසින් නැගි බුදුරැස් කඳෙහි ස්පර්ශ නුවූහ. ඉක්බිත්තෙන් බුදුන් සිරසට පිදූ සඳ මඬුලු සේ දස දහසක් මහා බ්‍රහ්මයෝ ද දස දහසක් සේසත් මතුමතුයෙහි තබා සිට ගත්හ. දස දහසක් ශක්‍රයෝ බුදුන්ගේ යසරැස් උරා බොන්නවුන් සේ දස දහසක් ජයතුරා සක් තුඩ තබා ගෙන එක විට ම පිඹින්නට පටන් ගත්හ. දස දහසක් සුයාම දෙවියෝ දස දහසක් චාමර සලති. දස දහසක් සන්තුසිත දෙවියෝ දස දහසක් මිණිතල්වැට සලති. සෙසු දෙවියෝ රන් තොරණ, රිදී තොරණ, ආදී දිව්‍ය පූජා භාණ්ඩ ගෙන පූජා කරන්ට පටන් ගත්හ. එකල දෙවියන්ගේ පූජා කෝලාහලයෙන් බ්‍රහ්මාණ්ඩය දක්වා වැදගත් මුහුදු ගිගුමක් සේ එකනින්නාද විය. එදා දෙවියන්ගේ අරගල සංහිඳුවා ලන්ට අන් කිසි සත්ත්වයෙක් නැත. බුදුන් වට සිට දස දහසක් ශක්‍රයෝ ඒ තමන් කළමනා ධූරය හෙයින් දස දහසක් දකුණු සක් පිට වතුරුවා ගෙන විසි දහසක් අත් ඔසවා එක විට අත් පොළසන් දී, "හෝ! හෝ! බණ පිරිස සංහිඳුව" යි කියා තුන් ලොව වෙවුල්ලා ඝෝෂා කළහ. ඒ වේලෙහි ඒ ශක්‍ර ඝෝෂාව අසා තුන් ලෝ පුරා සිටි දෙව්බඹ පිරිස් රැල නැති මුහුදු සේ නිශ්ශබ්ද වූහ. එකෙණෙහි දෙ ලක්ෂ සතළිස් දහසක් යොදුන් ඝන කඩ බොල් මහ පොළොව සාධුකාර දින. ඒ මහී නාදය හා සමග තමන් වහන්සේගේ ශ්‍රී මුඛ පද්මය විවෘත කොට බැණ නැගී බසින් සියලු බණ පිරිස දිවි සුවඳ පිඩක් සේ කරවමින්... (පන්සිය පනස් ජාතක පොත 2002: xxxvii පිට).

## නිගමනය

සමස්තයක් ලෙස සලකන විට සිංහල ජාතක නිදාන කතුවරයා හෝ එම මණ්ඩලය පරිවර්තකයෙකු සතු විය යුතු මූලාශ්‍රය භාෂාව, ඉලක්ක භාෂාව, විෂය හා සංස්කෘතිය යන අංග පිළිබඳ මනා අවබෝධයකින් මේ කාර්යයෙහි නියැලී ඇති බව පෙනේ. එහිදී සංක්ෂිප්ත කරණය, නව කොටස් එකතු කිරීම හා මූලාශ්‍රය දැක්වීමේ විධික්‍රමවලදී කතුවරයා ස්වකීය අනන්‍යතාව අරක්ෂා කර ගෙන තිබේ. ජාතක නිදානයෙන් ප්‍රකට කෙරෙන අනෙක් කරුණ වන්නේ උක්ත ක්‍රියාවලියේ දී සිංහල ජාතක පොතෙහි ශ්‍රාවක හෝ පාඨක සමාජය පිළිබඳ මනා අවබෝධයකින් කතුවරයා ක්‍රියා කර ඇති බව යි. එබැවින් ඇතැම් අවස්ථාවල පරිවර්තනය පදානුගත පරිවර්තනයක් වුව ද සමස්තයක් ලෙස සාර්ථක පරිවර්තනයක් සේ හැඳින්විය හැකි ය.

## මූලාශ්‍රය


කුලසූරිය, ආනන්ද එස්. සහ තවත් අය (2002) **පන්සිය පනස් ජාතක පොත ශාස්ත්‍රීය සංස්කරණය,** කොළඹ: ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.

පියතිස්ස හිමි, විදුරුපොල සංස්. (1926) **ජාතකට්ඨකථා 1 භාගය,** කොළඹ: සයිමන් හේවාවිතාරණ.

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (2002) **පාලි සාහිත්‍යය,** කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.

හරතසිංහ උපාධ්‍යාය (2003) **පාලි සාහිත්‍ය ඉතිහාසය,** හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි පරි. කොළඹ 10: ගොඩගේ සහ සහෝදරයෝ.

හේවාමානගේ, විමල් (2011) **'පෙරවදන' සරල බසට නැගුණු පන්සිය පනස් ජාතක පොත පළමු කාණ්ඩය,** සංස්. සිරි තිලකසිරි, කොළඹ 10: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

Abeynayake, Oliver (1984) *A Textual and Historical Analysis of the Khuddaka Nikāya,* Colombo.





Fasboll, V. ed.(2000) *The Jātaka Together with its Commentary, Vol. I,* Oxford: The Pali Text Society.

Hinuber, Oska Von (2000) *A History of Pali Literature,* Berlin: Walter De Gruyter.

Kulasuriya, Ananda Salgadu (1996) "Jataka" *Encyclopaedia of Buddhism, Vol. VI,* ed. W.G. Weeraratne, Colombo: Government of Sri Lanka.

Law, Bimala Carun (1971) "Buddhaghosa" *Encyclopaedia of Buddhism, Vol. III,* ed. G. P. Malalasekara, Colombo: Government of Ceylon.

Winternitz, Maurice tr. by V. Srinivasa Sarma, (1999) *History of Indian Literature* Vol. II, Delhi: Motilal Banarasdass.

Newmark, p. (1988) *A Textbook of Translation* Hertfordshire: Prentice Hall.